පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- ඉතිහාසය

22 සතිය

7 ශ්‍රේණිය

සැකසුම : එම්. ආර්. සී. දිල්රුක්ෂි
ර/මහඹිමාර විද්‍යාලය

## 1 ඒකකය-මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත් වීම.

### I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 1- 5 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

01. පුරාණ ජීවන රටාවේ ප්‍රධාන ක්ෂේත්‍ර තුන වන්නේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත හා ............................... යි.
02. බදුලු ටැම් ලිපිය පිහිටුවන ලද්දේ ............................... ගේ කාලයේදී ය.
03. අලුතින් ගිනි තබා සකස් කරගත් භූමිය ............................... ලෙස හැඳින්වේ.
04. සූප ශාස්ත්‍රයෙන් දක්ෂ කාන්තාවන් ............................... යනුවෙන් මූලාශ්‍ර වල දැක්වේ.
05. ............................... ගේ කාලයේදී මළ සිරුරු ගෙන යාමට සොහොන් පල්ලන් පත් කර සිටි බව මහාවංසයේ දැක්වේ.

(දේවානම්පියතිස්ස රජතුමා, මධුපාචිකා, නවදැලිහේන, පණ්ඩුකාභය රජතුමා, වෙළඳාම, හතරවන උදය රජතුමා)

ප්‍රශ්න අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. සාලිය කුමරු දුටුගැමුණු රජතුමාගේ පුතාය. ( )
07. අතීතයේ ගොපල්ලන් විසූ ගම් ගෝපාල ගම් යනුවෙන් හඳුන්වා ඇත.

( )

08. අනුරාධපුර රාජධානි අවධියේ දේවානම්පියතිස්ස රජතුමා ශ්‍රමිකයකු ලෙස වෙස් වලාගෙන කුඹුරක අස්වනු නෙලීමට සහභාගී වී ඇත. ( )

09. අතීත සමාජයේ විවාහය ඉතා ගෞරවනීය දෙයක් ලෙස සැලකිණි. ( )

10. ආගමික ස්ථානයක් අසළින් යනවිට අවමඟුල් පෙරහැර වල මළබෙර වාදනය කිරීම එකළ පැවති සිරිතකි. ( )

ප්‍රශ්න අංක 11 - 15 දක්වා ᴾ කොටසේ දක්වෙන ප්‍රකාශ වලට ගැළපෙන පිළිතුරු ඊ කොටසෙන් තෝරා යා කරන්න.

| ᴾ | ඊ |
|---|---|
| 11. කපා ගත් ගොයම් එකතු කොට සකස් කරගත් ගොයම් ගොඩ | 1. වලඤ්ජියාර් |
| 12. ගවයන්ගේ පිටේ භාණ්ඩ රැගෙන යාම | 2. රේගු නිලධාරීන් |
| 13. වළං සාදන්නන් හැඳින්වූ නාමය | 3. ගොයම් කොළය |
| 14. වෙළඳ ශ්‍රේණියකට උදාහරණයකි | 4. තවලම |
| 15.වරාය ආශ්‍රිතව කටයුතු කළ නිළධාරීන් | 5. කුඹල්කරුවන් |
| | 6. පෙහෙකාර |

අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. කටුසර බෝග වලට අයත් නොවනුයේ,

(i) තල (ii) මෙනේරි (iii) තණහාල් (iv) කුරක්කන්

17. තෝනිගල ශිලා ලිපියේ දක්වෙන ආකාරයට අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති ප්‍රධාන කන්න,

(i) දෙකකි (ii) තුනකි (iii) හතරකි (iv) පහකි

18. යකඩ වැඩ කරන්නන් හැඳින්වූ නාමය වූයේ,

(i) තඹකර (ii) පෙහෙකාර (iii) ලෝකුරුවන් (iv) මණිකාර

19. විදේශ වෙළඳාමේදී වැදගත් වූ වරායක් නොවන්නේ,

(i) මාතොට (ii) ගෝකණ්ණ (iii) ගොඩවාය (iv) අම්පාර

## II කොටස

පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. හේන් ගොවියා කළ යුතු කාර්යයන් මොනවාද?

02. හේන ආරක්ෂා කර ගැනීමට අතීත ගොවියන් අනුගමනය කළ ක්‍රම 3ක් ලියන්න.

03. පහත දක්වෙන වචන වල අර්ථ පැහැදිලි කරන්න.

නවදැලිහේන -

ගිනි යාතිකාව -

හැලි කටා -

04. තෝනිගල ශිලා ලිපියේ සඳහන් ප්‍රධාන කන්න තුන නම් කරන්න.

05. අතීතයේදී මෙරට සත්ත්ව පාලනයට යොදා ගත් සතුන් 04ක් නම් කරන්න. 06. බදුලු ටැම් ලිපියේ දැක්වෙන වෙළඳපොළ පාලනයට අදාළ නීති රීති 03ක් නම් කරන්න.

07. පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| මෙරටින් විදේශ රටවලට වෙළඳාම් කළ ද්‍රව්‍ය | විදේශ රටවලින් මෙරටට ගෙන එන ලද ද්‍රව්‍ය |
|---|---|
| ............................... | ............................... |
| ............................... | ............................... |
| ............................... | ............................... |
| ............................... | ............................... |

08. සංස්කෘතිය යනු කුමක්දැයි හඳුන්වන්න.

09. ඔබ දන්නා සාරධර්ම 02ක් ලියන්න.

10. අටවන අග්ගබෝධි රජතුමා තම මවට උපස්ථාන කළ ආකාරය පැහැදිලි කරන්න.